රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි :- 05/2015

මගේ අංකය : EST-7/OFTIM/07/1011
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2015.10.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාවන්</u>

1980.04.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 162 හි 09 වැනි ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී විධිවිධාන පරිදි, 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි වර්ගීකරණය අනුව ප්‍රාථමික ශ්‍රේණියට අයත් නිලධරයන්ගේ කාර්යාල වේලාව, විනාඩි 30 ක දිවා භෝජන විවේකය ද ඇතුළත්ව පෙ.ව. 8.00 සිට ප.ව. 4.45 දක්වා වේ. එහෙත්, ප.ව. 4.15 න් පසු රාජකාරි නොපවතී නම් එම නිලධරයන්ට ප.ව. 4.15 ට කාර්යාලයෙන් බැහැරව යාමට ඉඩ දීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හැකියාව ඇති අතර අතිකාල ගණන් බැලීමේ කාර්යයන් සඳහා පෙ.ව. 8.00 සිට ප.ව. 4.45 දක්වා වූ කාලය, කාර්යාල වේලාව ලෙස අදාළ කරගත යුතුය.

03. එමෙන්ම, කිසිදු සේවාවක් සඳහා ශ්‍රේණිගතව කාර්යාල වේලාව නියම කිරීම සිදුකර නොමැති අතර රාජ්‍ය නිලධරයන්ගේ කාර්යාල වේලාව සම්බන්ධයෙන් 2006.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 හි විධිවිධාන තවදුරටත් බලාත්මක වේ.

ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය